'SMART' පන්ති කාමරයක් විවෘත කළ බවට ප්‍රවෘත්තියක් අසන්නට ලැබිණ.

'SMART' සංකල්පයට අනුකූලව ලොව වැසි සියලු දෙනාටම 'සුහුරු' හෝ කඩවසම් විය හැකිනම් එය ඉතා අගනේය. ප්‍රායෝගිකව මෙම සංකල්පයට අදාළ කරගත හැකි උපාංග රාශියක් ලොව පුරා ප්‍රචලිත වෙමින් පවතී.

'SMART' ජංගම දුර කථනය, අධ්‍යාපන කටයුතු සඳහා ඉතා හොඳ සහායකයෙකු ලෙස සැලකිය හැකිය. එහෙත් අද අප සමාජයේ බොහෝ අය, මෙයින් නිසි ප්‍රයෝජන ගන්නේද යන්න සැකයකි. සමහරවිට එසේ සිදුවනුයේ 'SMART' යන්නෙහි නියම අර්ථය වන . "ස්වයං අධීක්ෂණය මගින්, විශ්ලේෂණය සහ වාර්තාකිරීමේ තාක්ෂණය, යන්න හරිහැටි අවබෝධ කර නොගැනීම නිසා වන්නට පුළුවන.

තවමත් බොහෝ දෙනෙකු සිතනවා වියහැක්කේ, එවැනි ජංගම දුරකථනයක් තිබීම තමන් 'ස්මාර්ට් හෝ කඩවසම්' ගණයට ගෙන ඒමේ සංකේතයක් ලෙස පිළිගැනෙන බවය. අද නිතර දකින්නට ලැබෙනුයේ විශ්ව විද්‍යාලවල, වෙනත් උසස් අධ්‍යාපන ආයතනවල සහ පාසල්වල අධ්‍යා පනය ලබන බොහෝ තරුණ තරුණියන් 'SMART' ජංගම දුරකථන 'සෙල්ෆි, ගොසිප්, චැට් වැනි සම්පප්‍රලාප සඳහා යොදාගන්නා බවයි. මෙම විද්‍යාර්ථීන් එවැනි දේ සඳහා නාස්ති කරනුයේ, අධ්‍යා පනය සඳහා වැය කළහැකි අගනා කාලය නොවේද? අප තරුණ තරුණියන්ගෙන් කී දෙනකු පර්යේෂණ කටයුතු, නිබන්ධන, පැවරුම්, අධ්‍යාපනික තොරතුරු සෙවීම්, වාර්තා සකස් කිරීම් වැනි කටයුතු සඳහා ජංගම දුරකථන හෝ අන්තර්ජාලය යොදා ගනිත්ද? මෙතරම් අග්‍රගණයේ තොරතුරු සපයන උපකරණයක් හුදු විනෝදය සඳහා පමණක් භාවිත කිරීම කාලය, ශ්‍රමය සහ ධනය නිකරුනේ අපතේ යැවීමකි.




පසුගිය දිනක පුවත් පතක කියවන්නට ලැබුණු, ලිපියකට අනුව , ඩේවිඩ් වොන්ග් නමැති අධ්‍යාපනඥයා ප්‍රකාශ කර තිබෙන

**'නව තාක්ෂණය දෙවියෙකු හෝ යක්ෂයෙක් වන්නේ මිනිසුන් එය භාවිත කිරීමට තෝරා ගන්නා ආකාරය අනුවය'**

යන කියමන මෙහිලා සඳහන් කිරීම වැදගත්ය.

අපගේ තරුණ පරම්පරාවද 'දෙවියා වෙනු වට යක්ෂයා තෝරාගෙන ඇති බව බොහෝ දුරට පැහැදිලි වේ. මෙයට ස්වයං පාලනයක් නොඑළඹෙන තත්ත්වයක් උද්ගත වන්නේනම් ඒ සඳහා නීතිමය පාලන ක්‍රමවේදයක් සකස් කිරීමට සිදුවේද? බොහෝ තරුණ තරුණියන් අතර 'SMART' උන්මාදයක් හටගෙන ඇත්තේදැයි කෙනෙකු තුළ සැකයක්ද ඇතිවිය හැකිය.

සීමා ඉක්මවා 'SMART' වීම අගතියට යන අවස්ථාද නැත්තේ නොවේ. පාසල් පද්ධති යේ මෙවැනි දේ සිදුවන එක් අවස්ථාවක් පෙන්වාදිය හැකිය.

සිසුනට පරිසරයේ විවිධත්වයට අදාළ සංකල්ප ඉගැන්වීමේදී 'ස්ථානීය පරිසර අධ්‍යයනී (on¡site environmental studies) යන නමින් හැඳින්වෙන, පරිසරයට පිවිස, ඇසින් දැක, කනින් අසා, නහයෙන් ආඝ්‍රාණය කර, අතින් ස්පර්ශ කර යම් යම් ස්වාභාවික ක්‍රියා දාමයන් හඳුනා ගැනීම් ආශ්‍රිතව ඉගැන්වීමේ ක්‍රමවේදයක් ගුරු සිසු දෙපාර්ශවයම අතර බොහෝ ජනප්‍රියවී තිබේ. එහෙත් මෙසේ එළිමහනට ගොස් ආශ් වාදයක්ද භුක්ති විඳිමින්, ලබන ඉගෙනුම වෙනුවට, වීඩියෝ දර්ශන වලට පමණක් සීමා වීමේ ප්‍රවණතාවක්ද ඇතිවීගෙන යන බවක් අසන්නට ලැබේ.

දැන් සිදුවනුයේ වනාන්තරයක අසිරිය පවා පරිගණක තිරයෙන් දැක තොරතුරු සටහන් කර ගැනීමකි. වනාන්තර අධ්‍යය නයකදී, කෙනෙකුගේ සියලුම ඉන්ද්‍රියය වලට හසුකර ගනිමින් ආශ්වාදයක්ද ලබාගත හැකි ක්‍රියාකාරකම් මගින් ලබන සංවේදීතාවය, 'SMART' වීම නිසා ඇසින් ඡායාරූප පමණක් දැකීමට සීමා වුවහොත්, එය ඛේදජනක තත්ත්වයකි. මෙය ගුරු සිසු කාගේත් අවධානයට යොමු විය යුතු කරුණකි.

අධ්‍යාපනයේ පමණක් නොව වෙනත් බොහෝ ක්ෂේත්‍ර වලද 'SMART' වීම නිසා මෙවැනි පසුබෑම් සිදුවනු දකින්නට තිබේ. ඒ කෙසේ වෙතත් පොදුවේ ගත්කළ තාක්ෂණික වශයෙන් 'SMART' වීම, ප්‍රගතියේ දැවැන්ත ඉදිරි පියවරක් ලෙස හැඳින්විය හැකිය.

මා කලින් සඳහන් කළ පුවත් පත් ලිපියෙහි 'SMART' යන්න පිලිබඳ අවබෝධයක් නොමැතිව වචනයේ අර්ථය පමණක් ගෙන 'SMART' හෝ 'කඩ වසම් වීමට තැත් කරන බොහෝ තරුණ තරුණියන්ට ගති ලක්ෂණයක් ලෙස වැළඳී එමින් පවතින මෙම උන්මාදය, 'සුහුරු කුලප්පුව්' ලෙස නම්කර තිබේ. එම අර්ථ කථනය ඒ ආකාරයටම දැක්වීම යෙහෙකැයි මටද සිතේ. ඇත්තටම එය පාලනය කරගත නොහැකි, චර්යාවක් වී ඇති නිසා 'කුලප්පු වක්ම' වේ.

**නුදුරු අනාගතයේදීම තරුණ පරපුරට 'සුහුරු කුලප්පුව් නිසා සිදුවිය හැකි ආපදා වලින් බේරා ගැනීම සඳහා මහා විප්ලවයක් කළයුතු බවට මතයක් ගොඩ නැගීමටද කාලය එළඹ තිබේ යයි විශ්වාස කරමි.**

**අනාගතයේදී සමස්ත ජන සමාජයටම සිදුවියහැකි මෙම ආපදාව සම්බන්ධව කාගේත් අවධානය යොමු කිරීම කාලෝචිත බව පෙනෙන්නට තිබේ.**

(තොරතුරු පොතපත සහ අන්තර්ජාලය ඇසුරෙනි.)




IMMIGRATION LAW @
Australian Immigration Law firm of the Sri Lankan Community

We are proud to have lead the way for others to follow...

Professional Immigration Legal Services
Legal Advice in simple to complex Immigration matters

- Skill Assessments
- State Sponsorships Expression of Interest (EOI)
- Visa Lodgments
- Employer Sponsorships & Nominations
- Migration Review Tribunal Appeals
- Federal Court Appeals
- Ministerial Appeals

General Skill Migration
457 Visas
Employer Nominated Migration
Student Visas
Graduate Skill Visas
Permanent Residence Pathways
Spouse Visas
Contributory Parent Visas
Business Migration
Resident Return Visas

A Team of Qualified & Experienced Lawyers & Registered Migration Agents



Susantha Katugampala
Principal
Barrister & Solicitor
Accredited Immigration Law Specialist
MARN: 9601070

FAIRFIELDS LAWYERS
AUSTRALIA GATEWAY

10 Morrison Place
East Melbourne 3002
Australia
T: 03 9650 4557
1300 888 331
M: 0417 851 041

Suite 602, Hilton Colombo
Residence 200
Union Place, Colombo 2
Sri Lanka
T: +94 11 2300 627
M:+94 777 347 670

info@fairfieldslawyers.com



We Deliver Results...